# පුරවැසි අධ්‍යාපනය හා පාලනය

## විෂය නිර්දේශය

10-11 ශ්‍රේණි

සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
2007

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## අභිමතාර්ථය

ශ්‍රී ලංකාවේ සුවිශේෂී ලෙසින් අරමුණු කරගෙන සිසුනට පාලනයේ හා ආර්ථික කටයුතු වල මූල ධර්මයන් හා ප්‍රායෝගික තලයන් අවබෝධ වන ආකාරයෙන් මෙම පාඨමාලාව සකස් වී ඇත. මෙමගින් ඔවුන් සමාජ පරිසරය තුල මිනිසාගේ ඵලදායී වර්ධනයට දායක වන ප්‍රජාතාන්ත්‍රික හා වගකිව යුතුද ව්‍යුහයන්හි හා ජීවන රටාවන්හි වැදගත්කම අගය කළ යුතුය.

## අරමුණු

- දේශපාලන සංකල්ප හා ඒවායේ ප්‍රායෝගික භාවිතයන් අවබෝධ කොට ගැනීම.
- ආණ්ඩුවේ අරමුණු හා අණ්ඩුවේ විවිධ අංශයන්හි ක්‍රියාකාරිත්වය අවබෝධ කොට ගැනීම.
- විවිධ දේශපාලනික මත විමසුම් පුළුල්ව විමර්ශනය කිරීමේ හැකියාව.
- විමර්ශනයේ හා ඇගයීමේ හැකියාව සමඟ ආර්ථික න්‍යායන් හා විවිධ ආර්ථික මූලධර්මයන් පිළිබඳ දැනුම.
- විවිධ ආයතන ,පුද්ගලයන්ට හා ඔවුන්ගේ අවශ්‍යතා ,ක්‍රියාකාරකම් , විෂයෙහි අවැසි ඵලය පිළිබඳ විචාරාත්මක අයබෝධයක්.

## ක්‍රමවේදය

මෙම විෂය මාලාවේ සිසුනට මූලික සිද්ධාන්තයන් පමණක් හඳුන්වාදෙන කොටස් ඇතුලත් ය. මේවායේ ඓතිහාසික වර්ධනයන් අදාල ලෙස හඳුන්වා දෙන අතරම සිසුන් ඇතැම් මූලධර්මයන් ශ්‍රී ලාංකික සංදර්භය තුල ප්‍රායෝගිකව භාවිතා කිරීමට පෙළඹවිය යුතුය.පාසල් පාදක ඇගයීම් ව්‍යාපෘති මගින් අනෙකුත් රටවල් හා සංසන්දනාත් 'මකව අධ්‍යනයන් කිරීමට යොමු කළ යුතු ය. ව්‍යුහයන් හා කාර්යයන් වෙන්කොට හඳුනා ගැනීමේ හැකියාව හා ඒවා සපුරා ගන්නා අරමුණු හා ක්‍රමවේද පිළිබඳවද අයබෝධය වර්ධනය කළ යුතු ය. පුරවැසියන් කෙරෙහි වගවීම මත පදනම් වූ ප්‍රජාතාන්ත්‍රීය පාලනයේ වැදගත්කම ඇගයිය යුතු ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# පුරවැසි අධ්‍යාපනය හා පාලනය

10 ශ්‍රේණිය (කාලච්ඡේද 10)

1. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය
2. බලය විමධ්‍යගත කිරීම හා බලය බෙදා හැරීම
3. බහු සංස්කෘතික සමාජය
4. වෙළෙඳපල ආර්ථිකය හා ආර්ථික සමඳතා
5. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක ගැටුම් නිරාකරණය

11 ශ්‍රේණිය (කාලච්ඡේද 60)

6. අධිකරණ පද්ධති
7. මධ්‍ය ආණ්ඩුව, පළාත් පාලන ආයතන හා පළාත් සභා
8. මානව හිමිකම්, යුතුකම් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය
9. පාරිසරික ගැටලු සහ තිරසාර සංවර්ධනය
10 ජාත්‍යන්තර සබඳතා

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

11 ශ්‍රේණිය (කාලච්ඡේද 60)

6. නීතිය හා සාධාරණත්වය (කාලච්ඡේද 15)

මෙහිදී සිසුනට නීතියේ මූලික සංකල්ප පිළිබඳ හඳුන්වාදෙනු ලබන අතරම අධිකරණ පද්ධතිය තුළින් එම මූලික සංකල්ප ඉටුවන ආකාරය මෙන්ම නීතියේ ආධිපත්‍යය පිළිබඳ වැදගත්කම ද වටහා දෙනු ලැබිය යුතු ය.

නිපුණතා

1. පුරවැසි නීතියේ ආධිපත්‍යය හා නිදහස් යුක්තිය පසිඳලීමේ ක්‍රමයක ඇති වැදගත්කම අගය කරයි.
2. විවිධ නීති ක්‍රම අවබෝධ කරගනියි - අපරාධ, සිවිල්, ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා.
3. ශ්‍රී ලංකාවේ වත්මන් අධිකරණ ක්‍රමය හා එහි වර්ධනය හඳුනා ගනියි.
4. ප්‍රජාතාන්ත්‍රික පද්ධතියක අධිකරණයේ භූමිකාව හා ආණ්ඩුවේ කොටස්වලට එහි ඇති අදාළත්වය අගයයි.
5. ගැටුම් නිරාකරණය සඳහා වන විකල්ප ක්‍රම පිරික්සයි.
6. යුක්තිය පසිඳලීම අවබෝධ කොට ගනියි.

විෂය අන්තර්ගතය

- විවිධ නීති ක්‍රම හා එක එකකට අදාළව රාජ්‍යයේ භූමිකාව.
- නූතන රාජ්‍යයේ අධිකරණයේ නිදහස තහවුරු කිරීම: ශ්‍රී ලංකාවට අදාළව.
- වත්මන් අධිකරණ පද්ධතිය හා එහි ඓතිහාසික වර්ධනය.
- රාජ්‍ය නීති නිලධාරීන්ගේ භූමිකා - අග්‍ර විනිශ්චයකාරවරයා, නීතිපති, අධිකරණ ඇමැති.
- අධිකරණ වර්ග ඒවායේ බලතල හා ක්‍රියාකාරිත්වයන්
    - මහේස්ත්‍රාත් අධිකරණය, දිසා අධිකරණය, මහාධිකරණය, අභියාචනාධිකරණය හා ශ්‍රේෂ්ඨාධිකරණය.
- විකල්ප ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රම හඳුන්වාදීම: උපදේශනය හා ඔම්බුඩ්ස්මන් මානව හිමිකම් කොමිසම.
- නීතියේ ආධිපත්‍යයේ වැදගත්කම හා සාධාරණව හා අප්‍රමාදව යුක්තිය පසිඳලීමේ වැදගත්කම.

සිසුන් වෙනත් රටවල නීති පද්ධතීන් විමසීමට යොමු කළ යුතු අතරම අධිකරණ පද්ධතියක වගකීම් හා නිලතල පිළිබඳ සන්සන්දනාත්මක අධ්‍යයනයන් කෙරෙහි යොමු කළ යුතු ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 7. ආණ්ඩුවේ විවිධ ස්ථර

### නිපුණතා

1. වත්මන් ව්‍යුහයන් ඓතිහාසික වශයෙන් මෙන්ම විශේෂිත අවශ්‍යතා පිළිබඳ වූ සන්දර්භයේ පිහිටා විශ්ලේෂණය කරයි.
2. වත්මන් ව්‍යුහයන්හි සංවර්ධනාත්මක හා අනෙකුත් අවශ්‍ය වෙනස්කම් පිළිබඳ අගය කරයි.

### විෂය අන්තර්ගතය

- මධ්‍යම ආණ්ඩුවේ, පළාත් සභාවල හා පළාත් පාලන ආයතනවල බලතල හා කාර්යයන්.
- පෙර පැවති තත්ත්වයන් හා වර්තමාන ව්‍යුහයන් හඳුන්වාදීම.
- ප්‍රාදේශීය ඒකකවලට බලය බෙදා හැරීමේ හේතු හා පවතින හා මතුවිය හැකි ගැටළු.
- අවශ්‍යතා මත පදනම්ව පළාත් සභා හා පළාත් පාලන ආයතනවල ඵලදායී බව.
- ආණ්ඩුවේ විවිධ මට්ටම්වල පුරවැසියා කෙරෙහි වන වගකීම හා වගවීම මෙන්ම ඒ හා බැඳුණු පුරවැසියන්ගේ වගකීම් හා යුතුකම්.

සිසුන් මේ මාතෘකා අධ්‍යයනය කළ යුතු වන්නේ සිද්ධාන්තමය වශයෙන් පමණක් සලකා නොව තමන් ජීවත්වන පෙදෙසෙහි අවශ්‍යතා පිළිබඳ ඇගයීමකද මත පිහිටාය. ඔවුන් රාජ්‍යයේ භූමිකාව පිළිබඳ පෙර අදහස් විමසා බලා හඳුනාගත් විවිධ ක්ෂේත්‍රයන්හි සම්බන්ධයෙන් වන ප්‍රාදේශීය ඒකකයන්හි භූමිකාවද විමසිය යුතු ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 8. මානව හිමිකම් හා යුතුකම්

මෙහිදී ස්ත්‍රී, පුරුෂ සමාජභාවය කෙරෙහි විශේෂ අවධානයෙන් යුතුව මානව හිමිකම් සංකල්පය පිළිබඳ දැනුම තහවුරු කෙරෙයි. එමෙන්ම විශ්ව අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන යුතුකම් හා වගකීම් අගය කිරීමක් ද සිදුවේ.

### නිපුණතා

1. මානව හිමිකම් නිර්වචනය හා සංකල්ප හඳුනා ගනියි.
2. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂාව සඳහා ගෙන ඇති පියවර විශ්ලේෂණය කරයි.
3. විශ්ව මානව අයිතිවාසිකම් සුරකීමේහිලා වන ස්වයං යුතුකම් හා වගකීම්වල වැදගත්කම අගය කරයි.
4. ඉහත අවබෝධය ස්ත්‍රී, පුරුෂ සම බව ඇතුළු සුවිශේෂී ගැටළුවලදී භාවිත කරයි.

### විෂය අන්තර්ගතය

- එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ ලියවිලි හඳුන්වාදීම හා ආරම්භක ප්‍රකාශයෙන් අනතුරුව හඳුන්වාදුන් අතුරු විධිවිධාන.
- ශ්‍රී ලංකාවේ මානව හිමිකම් සම්බන්ධ ව්‍යවස්ථා ප්‍රතිපාදනයන්හි වර්ධනය.
- සීමා හා පසිඳලීමේ හැකියාව විෂයෙහි වත්මන් තත්ත්වය.

සිසුන් ඉහත අධ්‍යයනයන්හිදී ළමා අයිතිවාසිකම් හා ස්ත්‍රී, පුරුෂ භාවය පිළිබඳව ද විශේෂ අවධානය යොමු කළ යුතු ය. ඔවුන් මේ අයිතිවාසිකම් සුරකීම සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය සාකච්ඡා කළ යුතු අතර එය ශක්තිමත් කිරීම සඳහා ක්‍රම යෝජනා කළ යුතු ය. එසේම ඔවුන් පුරවැසියන් විෂයෙහි අයිතිවාසිකම් පිළිබඳ අවබෝධය වර්ධනය කළ හැකි සාකච්ඡා කළ යුතුවාක් මෙන් ම ඒවාට සහයවීම මෙන්ම අදාළ යුතුකම් හා වගකීම් ඉටු කිරීම ද සාකච්ඡා කළ යුතු වෙයි. තොරතුරු දැනගැනීමේ අයිතිය බඳු කරුණු සාකච්ඡා කළයුතු වනුයේ ආණ්ඩුවේ විනිවිද භාවය හා වගකීම පිළිබඳ ව වූ සන්දර්භයේ හි පිහිටා ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 9. පාරිසරික ගැටළු හා තිරසර සංවර්ධනය (කාලච්ඡේද 20)

මෙහිදී නූතන සමාජීය හා ආර්ථික සංවර්ධනයෙහි පරිසරයට ඇතිවන තර්ජන පිළිබඳ අවබෝධ වර්ධනය කරන අතරම තිරසර සංවර්ධනය උදෙසා පරිසරය සුරැකීමේ අවශ්‍යතාව ඇගයීම වර්ධනය කරයි.

### නිපුණතා

1. පරිසරය සුරැකීමේ වැදගත්කම අගය කරයි.
2. පරිසරයට ඇති තර්ජනය හා ඒවායේ සාමාජික බලපෑම අවබෝධකොට ගනියි.
3. සංවර්ධන අවශ්‍යතාවයන් හා තිරසර සංවර්ධනය සළසන පාරිසරික හානි අවම වන සේ සමතුලිත බව රැකගැනීමේ වැදගත්කම අවබෝධකොට ගනියි.
4. තිරසර සංවර්ධනය විෂයයෙහි වැදගත්කම සලකා පාරිසරික ගැටළුවලට පිළිතුරු සොයයි.

### විෂය අන්තර්ගතය

- පරිසරය නිර්වචනය හා වර්තමානයෙහි ඇති විය හැකි පාරිසරික ගැටළු පිළිබඳ අවබෝධය.
- භෞතික, සාමාජයීය හා ජෛවීය පරිසරයට සිදුවන හානිවල බලපෑම.
- තිරසාර සංවර්ධන සංකල්පය හා හානි අවම කිරීමේ පිළියම් පිළිබඳ දැනුම වර්ධනය.
- පරිසරය සම්බන්ධ රජයේ මෙන්ම පුරවැසියන්ගේ ද වගකීම්.

සිසුන් සිය සමීප පරිසරය මෙන් ම වෙනත් ප්‍රදේශ සම්බන්ධයෙන් ද සිද්ධි අධ්‍යයනයන්හි යෙදිය යුතු ය. එසේම ඔවුන් අවම පාරිසරික හානියකින් සාමාජික හා ආර්ථික වර්ධනය සාක්ෂාත් කරගත් අවස්ථා පිළිබඳවද සැලකිය යුතු ය. මෙවැනි දේ පිළිබඳ ව පාරිසරික බලපෑම් ඇගයීම් හා ව්‍යවස්ථාපිත අවශ්‍යතා ද අවධාරණය කළ යුතු ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 10. ජාත්‍යන්තර සබඳතා (කාලච්ඡේද 20)

මෙහිදී සාමාජික හා ආර්ථික සංවර්ධනයේ ප්‍රයෝජන වැඩිදියුණු කිරීමේ වැදගත්කම හා ශ්‍රී ලංකාවේ තත්ත්වය කෙරෙහි විශේෂ අවධානයෙන් වර්තමානයේදී ලෝකය කෙරෙහි බලපාන ජාත්‍යන්තර සාධක පිළිබඳ අවබෝධය වර්ධනය කෙරේ.

### නිපුණතා

1. අද්‍යතන සමාජයේ ජාත්‍යන්තර සබඳතාවයන්හි වැදගත්කම අගය කරයි.
2. ජාත්‍යන්තර සබඳතාවන්හි වර්තමාන තත්ත්වය හා ශ්‍රී ලංකාව කෙරෙහි යම් යම් රටවල බලපෑම විමර්ශනය කරයි.
3. තෝරාගත් ජාත්‍යන්තර හා ප්‍රාදේශීය සංවිධානවල ව්‍යුහය අවබෝධ කොට ගනියි.
4. සුවිශේෂී අරමුණු සඳහා ජාත්‍යන්තර සබඳතා වර්ධනය කර ගැනීමෙන් ශ්‍රී ලංකාවට ඇතිවන යහපත විමසයි.

### විෂය අන්තර්ගතය

- ජාත්‍යන්තර සබඳතාවල අර්ථය හා වැදගත්කම.
- බලපෑම් ඇති කරන රටවල් හා ශ්‍රී ලංකාව කෙරෙහි ඇති විය හැකි බලපෑම.
- ජාත්‍යන්තර ආයතන - එක්සත් ජාතීන්ගේ සංවිධානය හා අනුබද්ධිත සංවිධාන.
- සාක් සංවිධානය හා වෙළඳ හවුල් ඇතුළුව ප්‍රාදේශීය සංවිධාන.
- ජාත්‍යන්තර සබඳතා මාධ්‍යයන් - තානාපති සේවය, වෙළඳාම, යුද්ධය, විදේශාධාර, පරිත්‍යාග, සාමය හා සංවර්ධනය.

සිසුන් ශ්‍රී ලංකාවේ සංවර්ධන කාර්යයනට දායක වන හෝ විය හැකි සංවිධාන හා රාජ්‍යයන් සමඟ සබඳතා ඇසුරින් ඉහත කරුණු අධ්‍යනය කළ යුතු ය. ද්විපාර්ශ්වික හෝ වෙනත් ආකාරයේ සබඳතා වර්ධනය වන ආකාරයෙන් ක්‍රියාකාරකම්වල යෙදීමට සිසුන් යොමු කළ යුත ය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.